නිපුණතාවය - ව්‍යාපාර සාර්ථකත්වය සඳහා අලෙවි කළමනාකරණයේ දායකත්වය අගයයි...

## නිපුණතා මට්ටම්

14.1 අලෙවිකරණයට පදනම් වූ මූලික සංකල්ප විමසයි

❖ අලෙවිකරණය හා විකිණීම අතර පවතින වෙනස්කම් පැහැදිලි කරන්න

❖ අලෙවිකරණය හා විකිණීම පිළිබඳ පහත ප්‍රකාශන අතුරෙන් අසත්‍ය ප්‍රකාශය වන්නේ

1. අලෙවිකරණය පුළුල් ක්‍රියාවලියක් වන අතර විකිණීම පටු ක්‍රියාවලියකි
2. විකිණීම අලෙවිකරණ ක්‍රියාවලයේ එක් කාර්යයක් පමණි
3. විකිණීම එම කාර්යයෙන් පසුව නිමා වුවද අලෙවිකරණය විකිණීමට පෙර හා පසු ක්‍රියාත්මකවේ
4. විකිණීමකදී සමාජය කෙරෙහි අවධානය යොමු කළද අලෙවිකරණයේදී සමාජය පිළිබඳ අවධානය යොමු නොකරයි
5. විකිණීමේදී නිෂ්පාදිතය කෙරෙහි අවධානය යොමු කළද අලෙවිකරණයේදී පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා කෙරෙහිද අවධානය යොමු කරයි

(.....)

❖ ඉලක්ක වෙළඳපොලක් තෝරා ගැනීමට හේතු මොනවාද?

❖ තම නිෂ්පාදිතය පාරිභෝගිකයාගේ මනසෙහි නොමැකෙන ලෙස ස්ථාපිත කිරීමට අනුගමනය කළ හැකි උපක්‍රම මොනවාද?